# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## பதிவாளர் நாயகம் திணைக்களம்
## REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } RG/AB/01/කාර්යාල නියෝග

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
**HEAD OFFICE**

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

ඔබේ අංකය / உமது இல. / Your No. }

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date } 2022-11-01

<u>චක්‍රලේඛ අංක: 05/2016 (I)</u>

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**<u>කාර්යාලයෙන් බැහැර ස්ථානවලදී</u>**
**<u>විවාහ ලියාපදිංචි කිරීම සඳහා අවසර ලබාගැනීම</u>**

රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් 2016-06-22 දිනැතිව ඉදිරිපත් කල දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක:05/2016 මගින් කාර්යාලයෙන් පිටත විවාහ සිදුකිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු බව සඳහන් කර ඇත. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ බලතල විමධ්‍යගත කිරීමේ එක් පියවරක් වශයෙන් 2022-10-19 දිනැති අංක:14/2022දරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛය මගින් ප්‍රාදේශීය කාර්යාලවල විෂය පථය නීතිගත කිරීම යටතේ උක්ත විවාහ ලියාපදිංචිය වෙනුවෙන් අනුමැතිය ලබාදීම සඳහා කළාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත බලතල පවරා ඇත. මේ අනුව, ග්‍රාමීය රෙජිස්ට්‍රාර්වරයෙකු කැඳවා ගැනීමේ පහසුකමක් නොමැති අවස්ථා සහ අත්‍යවශ්‍යම සුවිශේෂී අවස්ථාවකදී එවැනි ඉල්ලීම් කළාප භාර නි.රෙ.ජ/ස.රෙ.ජ වෙත අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වන අතර, මෙම චක්‍රලේඛයේ විධි-විධාන 2022-11-01 දින සිට ක්‍රියාත්මක වේ.

02. කොට්ඨාශයේ විවාහ රෙජිස්ට්‍රාර්වරයා කැඳවාගැනීමේ හැකියාවක් නොමැති අස්ථාවලදී ඒ බවට රෙජිස්ට්‍රාර්වරයාගෙන් ලබාගත් ලිඛිත තහවුරුවක් සමග විවාහ පාර්ශ්වකරුවන් වෙතින් අදාල ඉල්ලීම ලබාගෙන යොමුකල යුතු අතර, ඒ සම්බන්ධයෙන් සලකා බලනු ලබන්නේ අවම වශයෙන් විවාහ ලියාපදිංචි කිරීමේ දිනට දින 14කට පෙර කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත තම ආසන්නතම අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය ද සහිතව යොමු කර ඇත්නම් පමණි. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කටයුතු මහජනතාවගේ හිතසුව පිණිස විමධ්‍යගත කර ඇති බැවින්, කාර්යාලයෙන් පිටත විවාහ ලියාපදිංචිය සඳහා ඉල්ලීම් ප්‍රධාන කාර්යාලය වෙත යොමු නොකළ යුතු බව වැඩිදුරටත් දන්වමි.

03. කෙසේ වෙතත් කාර්යාලයෙන් පිටත විවාහ ලියාපදිංචි කිරීමේදී තමන් වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත රාජකාරිවලට බාධා ඇති නොවන අයුරින් කටයුතු කරන ලෙසත්, අනිකුත් අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් හා විවාහ රෙජිස්ට්‍රාර්වරුන් සමග සහයෝගයෙන් කටයුතු කරන ලෙසත් මින් අවධාරණය කරමි.

04. ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත අදාල නිලධාරීන් සහ කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් ඉල්ලීම් සම්බන්ධයෙන් පෙර පරිදිම ක්‍රියාකළයුතු බව වැඩිදුරටත් දන්වමි.

පී.එස්.පී.අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්

දුරකථන අංකය :-011-2889490
ෆැක්ස් :-011-2889491
විද්‍යුත් ලිපිනය :-rg.rgdepartment@gmail.com

**<u>පිටපත්:</u>**

- අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්
- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන/සිවිල්/නොතාරිස්)
- සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්
- ප්‍රධාන ගණකාධිකාරී
- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් } ඉහත පරිදි අවශ්‍ය කටයුතු සඳහා